# අරිය පරියෙසනය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක
අහුන්ගල්ලේ සීවක හිමි

සංකීර්ණ අසහනකාරී ලොවක අපි ජීවත්වෙමු. විද්‍යාවේ දියුණුව සතුටට පත්වීමට වඩා තැති ගැන්මක් මිනිස් ප්‍රජාවගේ හදවත්හි ඇති කරවයි. බලවත් ජාතීන් න්‍යෂ්ටික අවි ආයුධවලින් එකිනෙකා පරයමින් බලවත් වීම නිසාත්, ඔවුනොවුන් කෙරෙහි බිය නිසාත් ලෝකවිනාශකාරී යුද්ධයක් නොදකීමේ වාසනාව අපට හිමිවී ඇත. යම් ලෙසකින් ඔවුන් අතර ගැටුමක් ඇතිවුවහොත් එහි ප්‍රතිඵල දකීමට මිනිසෙක් ඉතිරි නොවේයයි ද ඔවුහුම පවසති. විද්‍යාවෙන් දියුණුවූ යාන්ත්‍රික ලොවක කලබලකාරී ජීවිතයකට කොටු වී සිටින මිනිස් සමාජය තුළ ජීවිතය කෙරෙහි අප්‍රසන්න හැඟීමක් ඇති බව පෙනේ. මේ නිසා වත්මන් ලොව මිනිස් වාසයට නුසුදුසු තැනක් බවට පරිවර්තනය කිරීමේ කාර්‍යයෙහි අප දැනුවත්වම හෝ නොදැනුවත්වම නිරතව සිටින බව පිළිගත යුතුය.

විද්‍යාඥයන්ගේ විවිධ පර්‍යේෂණවලින් මිනිසාගේ මූලික ගැටළුවලට නියම පිළිතුරක් සැපයීමට වඩා ඒවා තවත් අවුල් සහගත කර ඇතිබව පෙනීයයි. යායුතු නොයායුතු මග නොමග නොදන මං මුළාවූ පර්‍යේෂකයෝ තම සෙවීම්වලින්ම සෑහීමකට පත්වූ බවක් පෙනෙන්නට නැත. එවැනි පර්‍යේෂණවලින් අවුල් වූ ලොවකට භාග්‍යවත් බුදුපියාණන් දෙසූ " අරිය පරියේසනය " හෙවත් උතුම් සෙවීම පිළිබඳවූ පණිවුඩය දීමට උචිත කාලයක් ලෙස මෙම අවධිය නිශ්චය කිරීම නිවරදය.

අවිච්ඡින්නව යටින් දිවෙන හීන් හුයක් මෙන් බුදුපියාණන් දැක්වූ අරිය පරියෙසනයට අදළ කරුණු ත්‍රිපිටකය පුරාම දකිත හැකිය. එසේ වුවද අරිය පරියේසන සූත්‍රයේදී(1) බුදුහු පර්‍යේෂණ දෙකක් දක්වූහ. එනම් ආර්‍ය පර්යේෂණය හා අනාර්‍ය පර්‍යේෂණයයි. සරලව කිවහොත් උතුම් සෙවීම හා පහත් සෙවීමයි. එම සූත්‍රයෙහි දැක්වෙන පරිදි අනාර්‍ය පර්‍යේෂණය නම් මෙලොව සමහරු තමන් ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදියට යටත්ව සිට ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදි දේවල්ම සොයති. රැස් කරති. මේ ජාති, ජරා, ආදි දේවල් නම් අඹුදරු, ඇත්, අස්, ගව, මහිෂ, ගෙවල්, දෙරවල්, වතුපිටි ධන ධාන්‍ය ආදි මිනිසා ආදරයෙන් මමත්වයෙන් රැස්කරගෙන සිටින දේමය.

ආර්‍ය පර්‍යේෂණය නම් තමන් ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදි දෙයින් මිදීමට උත්සාහ කිරීම හා එයින් මිදීමයි. එසේ මිදුන පුද්ගලයාට අඹුදරු, ගෙවල්, දෙරවල්, වතුපිටි ආදි වස්තුවල බැඳීමක් නොවේ. බුදුපියාණන්වහන්සේත් බුදුවීමට ප්‍රථම අනාර්‍ය පර්යෙෂණයේ යෙදුන බවත්, දැන් ආර්‍ය පර්‍යේෂණයෙන් උතුම් බුද්ධත්වය හිමිකරගෙන සිටින බවත් දක්වා වදාළහ.

බෝධිසත්වයන් වහන්සේ දීපංකර පාද මූලයේදී ලත් විවරණයෙන් පසු මේ උතුම් සෙවීමේ යෙදීමට අදිටන් කරගත් අයුරු මෙසේ දැක්වේ.

> ජාති ධම්මො ජරාධම්මො—ව්‍යාධිධම්මො ච හං තදා
> අජරං අමරං ඛෙමං —පරියෙසිස්සාමි නිබ්බුතිං 2

මම ජාති, ජරා, ව්‍යාධි, මරණයන්ට යටත්ය. එනිසා එයින් මිදුණු උතුම් නිවන සොයන්නේ නම් යෙහෙකි. මෙසේ එද ඇතිකරගත් සිතිවිල්ල අනුව නිවන් ප්‍රතිපදාව වූ අරි අටඟ මගෙහි යමින් දන සීලාදි දසපාරමී දම් උපරිම මට්ටමෙන් සපිරූ උන්වහන්සේ ලොවුතුරු බුද්ධත්වයට පැමිණ තවත් විශාල පිරිසකට ඒ උතුම් රසය දුන් අතර උත්සාහවත් ඕනෑම අයෙකුට යායුතු මාර්ගයද විවෘත කොට තැබූහ. සිදුහත් කුමරාට ද අභිනිෂ්ක්‍රමණය කිරීමට හේතු වූයේ මහල්ලෙක්–ලෙඩෙක්–මළ කඳක් යන තුන් පෙරනිමිතිවලින් දැක්වූ ජාති–ජරා–මරණ–ව්‍යාධි යන ජීවිතයේ අවස්ථාවන් තමන්ටම ආරෝපණය කොට සිතා බැලීමය. මේ අනුව බලනවිට බුදු දහමේ උගන්වන ආර්‍ය පර්‍යේෂණය කළ යුත්තේ තමන් පිළිබඳවමය.

එසේ බැලීමේදී උපකාර කරගතයුතු කරුණු තුනකි. එනම් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම - යන ත්‍රි ලක්ෂණ යි. මේ තිලකුණු පිළිබඳව ප්‍රඥාවෙන් බැලීම විශුද්ධිය ලබා ගැනීමේ මාර්ගය ලෙස දක්වෙයි(3)

ලොව දක්නට ලැබෙන සවිඤ්ඤාණක - අවිඤ්ඤාණක සියලුම වස්තු විනාශයට විපරිනාම ස්වභාවයට පත්වේ. මිනිස් ජීවිතයද එසේමය. සත්වයා-පුද්ගලයා-ආත්මය යනුවෙන් කෙනකු නැති වුවත් ආත්මීය සංකල්පයන් අප තුළ ඇත. එසේ සංකල්පයන් ගොඩනගා ඇත්තේ පඤ්චස්කන්ධය පිළිබඳ යථාභූත වැටහීමක් නොමැති බැවිනි. රූප-වේදනා-සඤ්ඤා-සංඛාර විඤ්ඤාණ යන කොටස් පහේ සංකලනය නිසා පුද්ගලයා සත්වයා යනුවෙන් සම්මුතියක් ඇතිවුවත් එතන ඇත් තෙන්ම සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැතිබව වටහාගත යුතුය. කෙසේ වුවද මිනිසත් බවක් ලැබීම දුර්ලභ කරුණක් ලෙස දහමෙහි දක් වේ. මිනිසත් බවක් ලැබීම එසේ දුර්ලභ කරුණක් ලෙස දක්වූයේ ආර්‍ය පර්‍යේෂණය කිරීමෙන් පරිසමාප්තියට පත්වීමට මිනිසත් බව උපකාරීවන-හෙයිනි. එසේ වුවද මිනිස් බවත් ජාති - ජරා ආදි දුක්වලට යටත්වන හෙයින් එයද දුක් සහිතය. එනිසා දුක්ඛ සත්‍යය පිළිබඳ විස්තරයක් කරන ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී ජාතිපි දුක්ඛා-පෙ- පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා යනුවෙන් පඤ්චස්ඛන්ධයම දුක් සහිතබව වදළහ.

යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා යනුවෙන් යමක් අනිත්‍ය නම් එය දුක් බවත්. දුක් සහිත දේ ආත්මීය සංකල්පයෙන් ගැනීමට නොහැකි බවත් වදළහ. එසේ ගත් අය.

> පුත්තාමත්ථි ධනම්මත්ථි — ඉතිබාලො විහඤ්ඤති
> අත්තාපි අත්තනො නත්ථි — කුතො පුත්තා කුතො ධනං (4)

යනුවෙන් පුතුන්-ධනය-ආදි දේ පිළිබඳ ලොකු බැඳීමකින් මෝඩයා කටයුතු කරයි. නමුත් සත්‍යය වනුයේ තමාට තමාවත් නැති බවයි. එසේ නම් අන් දේ ගැන කථා කිරීමට අවශ්‍යතාවක් නැත. මේ පිළිබඳ යථාභූත දැනීමක් නැති අන්ධබාල පෘථග්ජනයා තම අවශ්‍යතාවටත් වඩා වස්තු රැස්කරගෙන එයින්ම වැනසී යයි. එවැනි වස්තුවල අනිත්‍ය - දුක්ඛ - අනාත්ම බව සිතීමට වත් කැමැති නොවේ. මේ පිළිබඳව කථා කිරීමේදී බුදුපියාණන් ධරමාන කාලයේම සිදුවූ පුවත් කීපයක් උදහරණ කළ හැකිය.

බුදු පියාණන් සමීපයෙහි වැඩසිටි වක්කලී හිමියන් බුදු සිරුරට ආදරය කළේ පුදුම බැතියකිනි. බුදු සිරුර දෙස දවස පුරා බලා සිටියත් වක්කලී හිමියන්ගේ ආශාව නොසන්සිඳුණි. මෙය හොඳින් දත් බුදුහාමුදුරුවෝ දිනක වක්කලී හාමුදුරුවන්ට "අපෙහි වක්කලී අපෙහි කිං තෙ ඉමිනා පූතිකායෙන දිට්ඨෙන " වක්කලී මෙතැනින් ඉවත්වෙව. මේ කුණු ශරීරය බැලීමෙන් ඇති ඵලය කුමක්දැයි වදළහ. මේ අනුව ශරීරය දෙතිස් කුණපයෙන් පිරුණු දෙයක් බව සිතා එහි ආලය අත්හැරිය යුතුය. බිම්බිසාර රජුගේ බිසවක් වූ ඛෙමා රූපය නිසා මානයෙන් යුත් තැනැත්තියක් වූවාය. ඇය බුදුපියාණන්ගේ උපක්‍රමයක් නිසා තම සිරුර කෙරෙහිම තිලකුණු දැකීමෙන් කලකිරී පැවිදිව රහත් වූවාය. ජනපද කල්‍යාණිය කෙරෙහි පෙම්බැන්ද නන්ද හිමි දෙව්ලියන් ගැන බලාපොරොත්තුවෙන් හොඳට මහණ දම් පිරීමෙන් රහත්විය. සුභා තෙරිණිය තමා කෙරෙහි වසහවූ සල්ලාලයකුගෙන් බේරුනේ ඔහු වඩාත් ආදරය කළ තම ඇස ගලවා දීමෙනි.

මෙවන් බණකථාවලින් පඤ්චස්කන්ධය පිළිබඳ මමත්වය නිසාම සසරින් එතරවීමට අපහසු බවත් ඇල්ම දුරුකර ගත්විට නිවන් සාක්ෂාත් කිරීමට පහසු බවත් හෙළිවේ.

දසධම්ම සූත්‍රයේදී (5) " සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානා භාවො විනාභාවොති පබ්බ ජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං " යනුවෙන් සියලු ප්‍රිය මනාප දෙයින් වෙන්වීමට සිදුවන බව නිතර සිහිකළ යුත්තක් බව භික්ෂූන්ට ප්‍රකාශකරදී ඇත. එසේ කටයුතු කිරීමෙන් විමුක්තිය ලැබූ භික්ෂු භික්ෂුණීන් එහි ප්‍රීතිය භුක්ති වින්ද ආකාරය ථෙර ථෙරී ගාථාවලින් ප්‍රකාශ වේ.

වත්මන් ලොවට බුදුපියාණන් දෙසූ අරිය පරියේසනය අවශ්‍යම යුගයක් බව පිළිගත යුත්තකි. ජීවිතයේ යථා ස්වරූපය මුවහ කරන සසර ගමන දික් කරවන අනාර්‍ය පර්යේෂණයන්ගෙන් වත්මන් ලොව සම්පූර්ණය. පසිඳුරන් හික්මවීමෙන් ලබන සතුටට වඩා ඒවා පිනවීමෙන් නැළවීමෙන් ලබන

ප්‍රීතිය උසස් කොට තැකීමට පුරුදු වූ පිරිසක් සිටී. ඒ සඳහා අවශ්‍ය නවීන උපක්‍රම දවසින් දවස බිහි වෙයි. එසේ වුවද බුදු දහම "පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස" යනාකාරයට ප්‍රඥාවන්ත අයට කවදත් ප්‍රයෝජන ගත හැකි බව අවධාරණය කෙරෙයි.

කාම සම්පත් කෙරෙහි ආශාව තිබෙනතුරු ඒවායින් වෙන්විය නොහැකිය. එබැවින් කාම සම්පත්වලින් වෙන්වීමට නම් විරාග අදහස වැඩිය යුතුය. විරාග චේතනාව දියුණු වනවිට අභිනිෂ්ක්‍රමණය කළ හැකිය. අභිනිෂ්ක්‍රමණ අදහස සම්පූර්ණ වනවිට ලෞකික සියලු දෙයින්ම වෙන්වීම සිදුවේ. එහෙයින් ක්‍රමයෙන් මාර්ගඥනයන්ගෙන් කෙලෙස් නැසීගොස් පරම පවිත්‍රත්වයට හෙවත් රහත් බවට පැමිණේ.

නොයෙක් සූත්‍රවල සඳහන්වන ආර්යපර්යේෂණය සමාප්ත කළ රහතන් වහන්සේලා ප්‍රීතිය ප්‍රකාශ කරනුවස් කියූ උදාන වාක්‍යය මෙසේයි. යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණාජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අභිඤ්ඤාසි. (6) යමක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සසුන් වදිත්ද ඒ නිරුත්තරවූ මාර්ග බ්‍රහ්ම චරියාවසානවූ නිවන නොබෝකලකින්ම මේ අත්බවෙහිදීම විශිෂ්ඨ ඥනයෙන් දැන පසක්කොට පැමිණ විසීය. භවෝත්පත්ති ක්ෂීණවීය. (ඛීණාජාති) මග බඹසර වාසය නිමවන ලදී. (වුසිතං බ්‍රහ්මචරියං) ඒ සඳහා කටයුතු කරන ලදී. (කතං කරණීයං) රහත් බැව් පිණිස තවත් කටයුතු දෙයක් නැතැයි (නාපරං ඉත්ථත්තායාති) දැන ගත්තේය.

මේ අනුව බුදුපියාණන් දක්වූ අරියපරියෙසනය නිවන සෙවීම බව පැහැදිලිය. නිවනින් සැනසුන පුද්ගලයාට අන් පර්යේෂණවල අවශ්‍යතාවක් නැත. අන් පර්යේෂණවලින් මොන විස්කම් පැවත් සන්තානගත දුක්වලට පිළිතුරක් නොවන හෙයින් අනාර්යමය. අරියපරියේසන සූත්‍රයේම සඳහන් වන අයුරු ආර්ය පර්යේෂණ කළ තැනැත්තා ආශ්‍රවයන් ක්ෂය කළ කෙනෙකි. පවිටු මාරයාගේ නොදැක්මට යයි. තෘෂ්ණාව ක්ෂය කළ හෙයින් නැවත සසරෙහි ඉපදීමට නොපැමිණෙයි. එහෙයින් සදතනික සැනසීම ලබා ගැනීමට ඇති එකම මඟ ආර්ය පර්යේෂණය කිරීම හැර වෙන කුමක්ද ?


අංකිත ස්ථාන :

(1) මජ්ඣිම නිකාය.
(2) ජාතකට්ඨ කථා – දූරේ නිදාන
(3) ධම්ම පදය.
(4) ධම්මපදය
(5) ඛුද්දක නිකාය.
(6) දීඝ නිකාය – මහාසීහනාද සුත්ත.